# ප්‍රාණ පරිත්‍යාගි සාන්ත ස්තේපන් මුනි
මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය ක්‍රියා 6: 8-10 , 7: 54-60

*අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.*

"ස්වර්ගය විවර වී තිබෙනු මට පෙනේ."

ස්තෙපන්, දේව වරප්‍රසාදයෙන් ද ආනුභාවයෙන් ද පූර්ණ ව මහත් ලකුණු හා අරුම්පුදුම දේ ජනතාව අතර සිදු කෙළේ ය. එහෙත්, 'ස්වාධීන' යයි නම් ලත් ධර්මශාලාවට අයත් සිරේනියයන් සහ අලෙක්සන්ද්‍රියයන්ගෙන් ඇතැමෙක් ද සිලිසියාවේ සහ ආසියාවේ සමහරු ද නැඟිට ස්තේපන් සමඟ විවාද කළහ. ඔහුගේ කතාවෙහි ගැබ් වූ ප්‍රඥාව හා ශුද්ධාත්ම බලය අභිබවා නැඟී සිටීමට ඔවුනට නොහැකි විය.

ඔව්හු ස්තේපන්ගේ වදන් අසා ඔහුට විරුද්ධ ව කෝපයෙන් දිලිහී දත්මිටි කෑහ. එහෙත් ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණ ව, ස්වර්ගයට බැල්ම හෙළා, දෙවියන් වහන්සේගේ තේජශ්‍රීයෙන් උන් වහන්සේගේ දකුණු පැත්තේ ජේසුස් වහන්සේ නැඟිට සිටිනවාත් දැක, "අන්න, ස්වර්ගය විවර වී ඇත, මනුෂ්‍ය-පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ දකුණු පස නැඟිට සිටිනවා මට පෙනේ ය"යි කී ය. එහෙත් ඔව්හු මහත් ශබ්දයෙන් මොරහඬගසා, තමන්ගේ කන් වසා ගෙන, එක සිතින් ඔහු පිටට කඩා පැන, ඔහු නුවරින් පිටතට ඇද ඔහුට ගල් ගැසූ හ. සාක්ෂිකාරයෝ තමන්ගේ ඇඳුම් සාවුල් නම් යෞවනයෙකුගේ පාමුල තැබූ හ. "ජේසුස් ස්වාමින් වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනවැ"යි කියා ස්තෙපන් යාච්ඤා කරද්දී ඔව්හු ඔහුට ගල් ගැසූ හ. ඔහු දණින් වැටී, "සමිඳාණන් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනවැ"යි මහ හඬින් මොරගසා කී ය. මෙසේ කියා ඔහු සැතපුණේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 31: 3-7, 15-16

පිළිතුර : සමිඳුනි, ඔබ අතට මාගේ ජීවිතය භාර කරමි.

ගීය : ඔබ මාගේ පර්වතය හා බලකොටුව ය.
එබැවින් ඔබේ නාමයේ අනුහසින් මට මඟපෙන්වා
මා ගෙන ගිය මැනව.
මා ඇල්ලීමට ඔවුන් සඟවා ඇති දැලෙන් මා බේරාගත මැනව.
ඔබ මාගේ රක්ෂස්ථානය ය.
ඔබ අතට මාගේ ජීවිතය භාර කරමි.
සත්‍යවාදී දෙවි සමිඳුනි, ඔබ මා මිදූ සේක.

බොරු දෙවි දේවතාවන් නමදින අයට මම ද්වේෂ කරමි.
එහෙත්, මම සමිඳුන් කෙරේ විශ්වාසය තබමි.
ඔබේ කරුණාව ගැන සතුටු වී උදන් අනමි.
ඔබ මාගේ දුක් පීඩා දුටු සේක:
ඔබ මාගේ සිත් වේදනා තේරුම් ගත් සේක.

මාගේ ජීවිත ගමන ඔබ අතෙහි ය.
මාගේ සතුරන් හා මට පීඩා කරන්නවුන් අතින් මා මුදා හැරිය මැනව.
ඔබ මෙහෙකරු වන මා දෙස කරුණාවෙන් බැලුව මැනව:
ඔබේ තිර පෙමින් මා ගැළෙවුව මැනව.

## සුපුවත් ජය නද ගීතාවලිය 118: 26, 27

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ නාමයෙන් වඩින තැනැත්තේ ආසිරි ලද්දෙකි.
සමිඳාණෝ දෙවිඳාණෝ ය: එතුමාණෝ අපට එළිය දුන් සේක.
ආලේලූයා!

## සුවිශේෂය

මතෙව් 10: 17–22

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

කතා කරන්නේ ඔබ නොව, ඔබ තුළින් කතා කරන
ඔබේ පියාණන්ගේ ආත්මයාණෝ ය.

මිනිසුන්ගෙන් පරෙස්සම් වන්න. මන්ද, ඔවුන් ඔබ උසාවිවලට පාවා දී, ඔවුන්ගේ ධර්මශාලාවල දී ඔබට තළනු ඇත. ඔවුන්ට හා විජාතීන්ට සාක්ෂියක් පිණිස ඔබ මා නිසා ආණ්ඩුකාරයන් ද රජුන් ද ඉදිරියට ගෙනයනු ලබනු ඇත. එහෙත්, ඔවුන් ඔබ පාවා දෙන කල, ඔබ කථා කළ යුත්තේ කෙසේ ද, කිව යුත්තේ කුමක් දැ යි සිතමින් කරදර නොවන්න. මන්ද, ඔබ කිව යුතු දේ නියම වේලාවේ දී ම ඔබට දෙනු ලැබේ. කතා කරන්නේ ඔබ නොව, ඔබ තුළින් කතා කරන ඔබේ පියාණන්ගේ ආත්මයාණෝ ය.

“තවද, සහෝදරයා තම සහෝදරයා ද පියා තම දරුවා ද මරණයට පාවා දෙන්නෝ ය. දරුවෝ ද මවුපියන්ට විරුද්ධ ව නැඟී සිට ඔවුන් මරණයට පත් කරවන්නෝ ය. මාගේ නාමය නිසා සියල්ලන් ඔබට වෛර කරනු ඇත. එහෙත්, අන්තිම දක්වා ස්ථිර ව සිටින්නා ගැළවෙන්නේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*